# නැති බැරි අය
# ඇති හැකි අය
# කරමු



BKT. 0127
5/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



" දිළිඳුකම තුරන්කිරීම සම්බන්ධයෙන් අනුගමනය
කළයුතු ප්‍රතිපත්තිමය ගුරුපදේශ "

පිළිබඳව ඉහළ මට්ටමේ නිලධාරි සමුළුව අමතා

**ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා**

කොළඹ, ' සව්සිරිපායේ ' දී
පැවැත්වූ දේශනය

**1989.02.13**

## " දිළිඳුකම තුරන්කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ප්‍රතිපත්තිමය ගුරුපදේශ "

පිළිබඳව ඉහළ මට්ටමේ නිලධාරී සමුළුව අමතා

## ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා

කොළඹ, ' සචිසිරිපායේ ' දී

පැවැත්වූ දේශනය

**1989.02.13**

තීරණ ක්‍රියාත්මක කරන මුල් පෙළේ නිලධාරීන් හැටියට තමුන්නාන්සේලා හැමදෙනාටම ජනසවිය පිළිබඳ පරමාර්ථය විස්තර කර දෙන්න මම කල්පනා කළා. ජනසවිය වැඩපිළිවෙලේ දර්ශනයක් තියෙනවා. ඒ දර්ශනය ප්‍රථමයෙන් අපි තේරුම් ගන්නට ඕන. ඒ දර්ශනය තේරුම් ගත්තොත් පමණයි ඊට අදාල ප්‍රතිපත්ති සකස් කරන්න පුළුවන් වෙන්නෙ. ඒ ප්‍රතිපත්ති නියම විදියට සකස් කරගත්තොත් පමණයි ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කරගන්න පුළුවන් වෙන්නේ. ඇත්තවශයෙන්ම මේ ජනසවියට අදාල වන කාරණා කීපයක් මම 1988 ජූලි මාසයේ 03 වැනිදා ආණමඩුවේ ගමුදාව පිළිබඳ අවසාන දිනයේදී ප්‍රකාශ කරන්නට යෙදුණා. එදා අවසාන දිනයේ ගමුදාව ජයන්තියට සහභාගී වුනේ අපේ හිටපු ජනාධිපති ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා. ඒ අවස්ථාවේදි මම කරපු කථාව මුද්‍රණය කරල තිබුණ. මගේ හිතේ තමුන්නාන්සේලාට ඒ කථාවේ පිටපත් බෙදාදීලා ඇති. මං තමුන්නාන්සේලාගෙන් කරුණාවෙන් ඉල්ලනවා ඒ මුළු කථාවම හොඳට කියවන්න කියලා. මේ ජනසවිය පිළිබඳ දර්ශනය, බින්දු මාත්‍රයක් ඒ කථාවේ ගැබ්වෙලා තියෙනවා.

මම ඉන් කොටස් කීපයක් තමුන්නාන්සේලාට කියවන්න කැමතියි. එම පොතේ අටවෙනි පිටුවෙන් කොටසක් මම කියවනවා. " **අපි මොන සංවර්ධනයක් ඇති කළත් එය දිළිඳු ජනතාවට පලක් ප්‍රයෝජනයක් ලැබෙන විදියට ඒ සංවර්ධනය ක්‍රියාත්මක විය යුතු බව තේරුම් ගත යුතුයි. කොයි සංවර්ධනයත් ඕන කරන්නේ ජනතාව ජීවත් කරවීමටයි. වාරිමාර්ග ඕන කරන්නේ ජනතාව ජීවත් කරවීමටයි. මහා මාර්ග ඕන කරන්නේ ජනතාව ජීවත් කරවීමටයි. විදුලි බලය ඕන කරන්නේ ජනතාව ජීවත් කරවීමටයි. විද්‍යාව ඕන කරන්නේ විද්‍යාව සඳහාම නොවෙයි. ජනතාව සඳහායි. තාක්ෂණය**

ඕන කරන්නේ තාක්ෂණය සඳහාම නොවෙයි. ජනතාවගේ සුබ විහරණය සඳහායි. ජනතාව බඩගින්නේ තියලා, ජනතාව මන්ද පෝෂණයට ඇදල දාලා ජනතාව මැරෙන්න සලස්වල, සංවර්ධනයක් කිරීමෙන් පලක් නැති බව අපි තේරුම් ගත යුතුයි. රජය හැමවිටම ජනතාවගේ සුබසෙත ගැනම හිතලා ක්‍රියාකරන්න ඕන. විද්‍යාව කා සඳහා ද ? තාක්ෂණය කා සඳහා ද ? විද්‍යාව මගින් කුස ගින්න නැති කරන්න බැරිනම්, ලෙඩ රෝග නැති කරන්න බැරිනම්, අබල දුබලකම් නැතිකරන්න බැරි නම්, ඒ විද්‍යාවෙන් අපට වැඩක් නැහැ. තාක්ෂණය මගින් දුගී දුප්පත්කම, රැකීරක්ෂා නැතිකම හා නැතිබැරිකම නැතිකරන්න බැරිනම් ඒ තාක්ෂණයෙන් අපට වැඩක් නැහැ. විද්‍යාඥයාට හා තාක්ෂණික විශේෂඥයාට නැතිබැරි අය සඳහා සහනය දෙන්න බැරිනම් ඒ විද්‍යාඥයින්ගෙන්, ඒ තාක්ෂණික විශේෂඥයින්ගෙන් මානව වර්ගයාට ඇති ඵලය කුමක් ද ? එහෙමනම් එයට වැඩි ලොකු පල ප්‍රයෝජනයක් දුගී දුප්පත් ජනතාවට මීහරකුන්ගෙන් ලැබෙන බව, එළහරකුන්ගෙන් ලැබෙන බව, ගැල් හරකුන්ගෙන් ලැබෙන බව අප තේරුම් ගත යුතුයි. ඒ අහිංසක සතුන් මොනම විද්‍යාවක් වත් මොනම තාක්ෂණයක්වත් නොදත මිනිසාට කොයි තරම් උපකාර කරනවාද ? " ඒ එක කොටසක් මගේ කථාවෙන් මම කියෙව්වේ.

තවත් තැනෙක සඳහන්වෙනවා "අද අපේ ජනගහනයෙන් භාගයක් ආහාර මුද්දරවලින් ජීවත්වෙනවා. ඒ ජනගහනය අපි මොනවිදියකින් නමුත් එයින් බේරාගන්න ඕන. දුගී දුප්පත්කමින් බේරාගන්න ඕන. අපේ රට පෝසත් රටක්. ජනතාවගෙන් අඩක් දිළිඳුවුනාට අපේ රට පොහොසත් ස්වාභාවික සම්පත්වලින් ආඪ්‍ය රටක්. මේ රට යුරෝපයක්, ඇමෙරිකාවක්, අප්‍රිකාවක් කරන්න අපට වුවමනා නැහැ. ආසියාවක් කරමු. ශ්‍රී ලංකාවක් කරමු. සාරධර්ම, ස්වශක්තිය, සාධාරණය ආදී ගුණවත් කම් තුළින් අපි මේ වැඩපිළිවෙළ ඇති කරන්න ඕන". තවත් තැනක සඳහන් වෙනවා "අපේ වැයම විය යුත්තේ මේ ඇති නැති පරතරය සම්පූර්ණයෙන්ම නැතිකිරීමයි. මුළු ලෝකයේම ගෞරවය දිනාගත්ත ඇමෙරිකාවේ කීර්තිමත් ජනාධිපතිවරයෙක් කිව්වා, 'යම් සමාජයකට බැරිනම් ඒ රටෙන්, ඒ රටේ වැඩි දෙනාවන දුප්පත් ජනතාව දුගී බවෙන් ගලවා ගන්න, ඒ සමාජයට කවදාවත් බැහැ ඒ සමාජයේ ඉන්න පොහොසත් ටික දෙනා ආරක්ෂාකරගන්න' කියා. ඒ ප්‍රකාශය කළේ ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිතුමා.

ජනතාවගේ ඕනෑ එපාකම් තේරුම් නොගෙන සමාජයේ ඉහළ මට්ටමේ අය හිතන දේ ජනතාව මත පටවන්න ගියොත් එයින් ඇතිවන්නේ නාස්තිය හා අප්‍රසාදය. අපි එක් එක් දරුපවුල අරගෙන ඒ එක් එක් දරුපවුලට ඇති

අඩුපාඩුකම් තේරුම් අරගෙන ඔවුන්ව ඒ අමාරුවෙන් ගොඩගන්න උදවු උපකාර කරන්න ඕන. ඒක තමයි මේ අවස්ථාවේ තිබෙන අත්‍යවශ්‍යතාවය. ඒක තමයි අප ඉදිරියේ තිබෙන අභියෝගය. නැතිබැරි ජනතාව තිහඩව දුක් විඳිනවා. ඡන්දය ගන්න නම් ඒ හැමදෙනාම හමුවෙන්න යනවා. අපි ඒ හැමදෙනාගෙන්ම ඡන්දය ඉල්ලා ගන්නවා. ඊට පස්සේ මොකද වෙන්නේ. සීමාසහිත පිරිසක් ඡන්දය ගත්ත අය වටකරගන්නවා, අපි මේ ගැන සමීක්ෂණයක් පැවැත්වුවා. එයින් පැහැදිලි වුනේ, ටිකදෙනෙක් ඡන්දය ගත්ත අය වටකරගෙන හැමදේම බෙදා ගැනීමයි."

තව තැනකින් මං කියවන්නම්, "අපි තේ දල්ලකට දක්වන සැලකිල්ල, රබර් පැලයකට දක්වන සැලකිල්ල, පොල් පැලයකට දක්වන සැලකිල්ල අපේ දරු පවුලකට, අහිංසක දුගී දුප්පත් දරු පවුලකට දක්වනවාද කියලා අපිම ටිකක් කල්පනා කරල බලන්න ඕන. තේ දල්ලකට කොයිතරම් සලකනවාද ? තේ පඳුරකට කොච්චර සලකනවාද ? කොච්චර විශේෂඥයෝ යවනවාද ? මේ තේ පැලය හැදෙන්නෙ නැත්තෙ ඇයි කියල බලන්න. මේ තේ දල්ලට මොකක්ද තියෙන රෝගය ? මේ පොල් පැලය හැදෙන්නෙ නැත්තෙ ඇයි ? මේ රබර් පැලයට මොකක්ද වෙලා තියෙන්නෙ ? එහෙමයි අපි තේ, පොල්, රබර් වලට සලකන්නෙ". තවත් තැනක සඳහන් වෙනවා, "පාසල්වලින් අස්වෙලා සමාජයට එන දහස් සංඛ්‍යාත තරුණ තරුණියන් අසහනයෙන් ජීවත් වෙනවා. ඔවුන්ව බිලිබාගෙන, ඔවුන්ව නොමඟට යොමු කරන්න නොයෙකුත් දුෂ්ඨ බලවේග ක්‍රියාකරනවා. ඒ නිසා අපේ යුතුකමක් තිබෙනවා, මේ රත්තරන් ජනතාව බලාගන්න. මේ ලක්ෂ ගණනින් මෙවැනි වැඩපිළිවෙළකට උදව් කරන ජනතාව අපි ආරක්ෂා කරන්න. අපට උදව් උපකාර කරන සියලු දෙනාටම, අපි කරුණාවෙන් කියන්නේ කරුණාකරලා අවුරුදු 10 කින් 12 කින්, 15 කින්, 20 කින් පල ප්‍රයෝජන ලබන වැඩවලට උදව් කරන්න, නමුත් ඊට ඉස්සෙල්ලා දැන්, වහාම අපේ ප්‍රශ්නවලට පිළියම් සොයන්නට අපට උදව් උපකාර කරන්න." මේ අපේ දර්ශනයේ ඉතාම සුළු කොටසක් පමණයි.

නමුත්තාත්සේලා දන්නවා, පසුගිය අවුරුදු එකොලහේම අපි අපේ රටට වුවමනා කරන මූලික අවශ්‍යතාවත් සම්පූර්ණ කරන්න ක්‍රියාකලා. වාරිමාර්ග පහසුකම් ඇති කරන්න ක්‍රියාකලා. මහවැලි ගඟ යෝජනා ක්‍රමය ඉන් එකක්. විදුලිය නිෂ්පාදනයට අවශ්‍යතාවත් සැපයුවා. මහවැලි ගඟ යෝජනා ක්‍රමය යටතේ දැන් විශාල ජලාශ පහක්ම හදලා තියෙනවා. ඒ ජලාශ පහෙන්ම ජල විදුලිය නිපදවනවා. ඒකේ තියම පලප්‍රයෝජන හැම ගමකටම මේ එන අවුරුදු දෙකේදී ලැබෙයි. මහා මාර්ග පද්ධතිය සකස් කරන්නට වැඩ ආරම්භ කරල

ක්‍රියාත්මක වෙනවා. වෙළහෙළඳම නිදහස් තත්ත්වයකට පත් කරල තියෙනවා. සුළු පරිමාණයේ හා මහ පරිමාණයේ කර්මාන්ත නවෝදයක් ඇති කරන්න විධිවිධාන යොදා තියෙනවා.

දැන් අපේ කල්පනාව මේ ඉදිරි අවුරුදු දෙකේදී. අපේ සම්පූර්ණ කැපවීම උත්සාහය යෙදෙන්නට ඕන. අපේ ජනගහනයෙන් භාගයක් වන මේ ආහාර මුද්දරවලින් ජීවත් වෙන ජනතාව නගා සිටුවන්න. පවුල් වශයෙන් ගත්තොත් පස්දෙනෙක් ඇතුලත් කළත් පවුල් පහළොස් ලක්ෂයක් විතර වේවි. ඒ පවුල් පහළොස් ලක්ෂය තුළ. සමහරවිට හැත්තෑලක්ෂයක් හෝ අසූ ලක්ෂයක් විතර වෙන්ට පුළුවන්. ඒ ජනතාව අද නැතිබැරිකමින් මිරිකිලා ඉන්නෙ. ඒ ජනතාව ඇති හැකි ජනතාවක් බවට පත් කරන්න ඕන. අපේ විද්‍යාව, තාක්ෂණය ඒ වගේම පරිපාලනය ආදී හැම ක්ෂේත්‍රයක්ම අපි දැන් යොමු කරන්න ඕන මේ අභියෝගයට. ජනතාව සවිමත් කරන්න. ශක්තිමත් කරන්න. අද ආහාර මුද්දර ලබන පස් දෙනෙක්ගෙන් යුක්ත පවුලකට, මගේ හිතේ දැන් වැඩිකරල තිබෙන මුදලුත් එක්ක බැලුවොත්, ආහාර මුද්දර ලැබෙන්නෙ නැහැ වැඩිම වුනොත් රුපියල් 350 කට වැඩිය. ඒ දරුපවුල ඒ මුදලින් ජීවත්වෙන්නේ කොහොමද ? වේලක් කෑවොත් අනිත් වේල කන්ට නැහැ. ඇඟේ තියෙන ඇඳුම මාරුකරල අඳින්න ඇඳුමක් නැහැ. ඒ උදවියගෙ දරුවෝ මන්ද පෝෂණයෙන් පෙළෙනවා. තමන්ට කියලා ඉඩම් කැබැල්ලක් නැහැ. ගෙයක් දොරක් නැහැ. අපි දැන් මේ උත්සාහ කරන්නෙ ජනසවිය මගින් අපේ ජනතාවට ශක්තියක් ලබාදෙන්න. අපි දැන් නොයෙක් ව්‍යාපෘතිවලට මුදල් ආයෝජනය කරනවා. දැන් අපි මුදල් ආයෝජනය කරන්නට යන්නෙ අපේ ජනතාව සඳහා. මගේ හිතේ ඉතාම පලදායක ආයෝජනය ජනතාව සඳහා කරන ආයෝජනය. අපි ඇති කරන සංවර්ධන වැඩවල ප්‍රයෝජනය ලබන්නේ ජනතාව තමා. ප්‍රයෝජනයක් ලබන්නට ඉන්න ඒ ජනතාව අපි ශක්තිමත් කරන්න ඕන. ජනතාව සංවර්ධනයට යොදා ගන්න ඕන. නිෂ්පාදනයෙන් තමයි රටක ධනය වැඩි කරන්න පුළුවන් වෙන්නේ. අපි, ජනතාව සම්බන්ධ කරගන්න නිෂ්පාදනයක් ඇති කරන්න ඕන. මෙ ජනසවිය වැඩ පිළිවෙළ ඒ සඳහායි.

අපට වුවමනා කරනවා මේ ජනතාව ශාරීරික වශයෙන් පෝෂණය කරන්න. එතකොට තමයි ඔවුන් නිරෝගී ජනතාවක් වෙන්නේ. එවැනි ජනතාවකට තමයි සංවර්ධනයට හවුල් වෙන්න පුළුවන්. නිෂ්පාදනයට සහභාගී වෙන්න පුළුවන්. ඒ සඳහා තමයි මාසයකට රුපියල් දෙදහස් පන්සීයක් දෙන්නට යන්නේ. මෙ මුදල කාට දිය යුතුද කියන එක ගැන තේරීමක් කරන්න දැන් අවශ්‍ය නැහැ. ඔවුන් කවුද කියලා දැන් නම තියමවෙලා තියෙනවා. ආහාර මුද්දර ලබන දරු පවුල්. ආහාර මුද්දර ලබන්ට සුදුසුකම් තියෙන දුප්පත් දරු පවුල්. මේ උදවිය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අළුතින් තෝරන්නට අවශ්‍යතාවයක් නැහැ. නමුත් මේ උදවිය කවුද කියලා හඳුනා ගැනීම අවශ්‍යයි. ඒ හඳුනාගැනීම කළ යුත්තේ ගමේ මට්ටමේදී. ජනතාව ඉදිරියේමයි. එහෙම නැතුව නිලධාරීන් ගෙයක් ගෙයක් ගානේ ගිහිල්ලා කොළයක් පුරවා ගෙන කරන හඳුනා ගැනීමක් නොවෙයි. අපි දැන් තීරණය කරලා තිබෙනවා ගම්මාන විසිපන්දහසක් මේ සඳහා යොද ගන්න. ඒ ගම්මානයට යන්න ඕන. අපි ඒකකයක් පිහිටුවනවා. රජයේ නිලධාරීනුත් ගමේ නියෝජිතයිනුත් ඊට සම්බන්ධවෙන්න ඕන. මුළු ගමම එකට රැස්කරන්න ඕන. දැන් ආහාර මුද්දර ලබන අයත්, ආහාර මුද්දර ලබන්න සුදුසුකම් තියෙන අයත් කැඳවන්නට ඕන එක එක පවුල බැගින්. එතකොට මුළු ගමේම වැසියෝ මේක බලාගෙන ඉන්නවා. අන්න ඒ විධියටයි මේ හඳුනා ගැනීම කරන්නේ. එහෙම නැතිව මේක රහසේ කරන වැඩ පිළිවෙළක් නොවෙයි. එතකොට මෙ ගම්මාන විසිපන්දහස තුළ අපි ඇති කරන ඒකකය මේ දරු පවුල් ගැන සොයා බලන්නට ඕන. මේ රුපියල් දෙදහස් පන්සීයෙන් කොටසක් පාරිභෝජනයටත්, කොටසක් ඉතිරි කිරීමටත් යොදවනවා. පාරිභෝජනය පිළිබඳ ඔවුන්ට උපදෙස් දෙන්න ඕන. පෝෂ්‍යදායක ආහාර තමන්ට වගා කර ගන්නත් පුළුවන්. ඔවුන් ඒ සඳහා යොමු කරන්න ඕන. එහෙම නැත්නම් මේ මුදල් අනිසි ලෙස වියදම් වන්නට පුළුවන්. මේක පිං පඩියක් නොවෙයි. ජනතාවගේ පෝෂණයට හා වැඩි දියුණුව ඇති කිරීමට කරන උපකාරයක්. ගමේ පිහිටුවන ඒකකය ජනතාවට මේ අතින් උපදෙස් දෙන්න ඕන. ඔවුන් යොමු කරන්න ඕන. ඒ සඳහා ඉතිරි කරන මුදල් බැංකුවේ තැන්පත් වෙනවා. මාස 24 කදී ඒ මුදල රුපියල් විසිපන්දහසක් වෙනවා. එම මුදල් ඒ දරුපවුලට පුළුවනි කිසියම් ව්‍යාපාරයකට යොමු කරන්න. එතකොට ඒ විසි හතර මාසය තුළදී මේ ඒකකය, මේ එක එක දරු පවුලේ රුචි අරුචිකම් සොයා බලා, හැකිකම් සොයා බලා ඒ උදවිය එක්කෝ වෙළඳාමකට, එහෙම නැත්තම් සුළු කර්මාන්තයකට, එහෙම නැත්තම් ගොවිතැනට යොමු කරන්න ඕන. ඒ, අර ආහාර මුද්දර ලබන එහෙම නැත්තම් ආහාර මුද්දර ලබන්ට සුදුසුකම් ඇති, එහෙම නැත්තම මේ අන්ත දුගී දුප්පත් දරු පවුල්.

ඒ හැර තවත් දරු පවුල් ඒ ගම්මානයේ ඉන්නවා. ඒ දරු පවුල් මේ රුපියල් දෙදහස් පන්සීය ලබන්නට සුදුසුකම් නැති අය. ඒ උදවිය යමක් කමක් තියෙන අය. අර ඒකකය ඒ උදවියත් හමුවෙන්නට ඕන වෙන වෙනම. ඒ දරු පවුල් ගැනත් සොයන්න ඕන, බලන්නට ඕන. ඔවුන්ගේ දුර්වලකම් මොනවාද ? අඩුපාඩුකම් මොනවද ? ඔවුන්ගේ ශක්තිය මොනවද ? ඔවුන්ට මොනවද තියෙන්නේ ? ඒ හැකිකම්, ඒ ශක්තිය ඔවුන්ට වඩාත් ප්‍රයෝජනවත් වන විධියට යොද ගන්නේ කොහොමද කියලා ඔවුන්ට උපදෙස් දෙන්න ඕන. රජය විසින් දෙන ණය තිබෙනවා. ආධාර උපකාර තියෙනවා. ඒවා ගැන හුඟක් දරු පවුල් දන්නෙ නැහැ.

ඒ දරු පවුල්වල ඉන්න පුළුවන් දක්ෂ පක්ෂකම් ඇති අය. අන්න දුගී දුප්පත් ආහාර මුද්දර ලබන දරු පවුල්වලත් හැකියාවන් තිබෙන, දක්ෂකම් තිබෙන, සූරකම් තිබෙන, උදවිය ඉන්නවා. අපි මෙච්චරකල් ඔවුන් ගාව තිබෙන අඩුපාඩුකම් සෙව්වා මිසක්, නැති බැරිකම් බැලුවා මිසක් ඔවුන්ගේ හැකියාවන් ගැන අවබෝධයක් ඇති කර ගත්තේ නැහැ. ඊයේ පෙරේද මට අහන්න අවස්ථාවක් ලැබුණා ගම්බද දුප්පත් දරු පවුලක ළමයෙකුගේ කවි ගායනාවක්. ඒ දූරිය ඒ කවි පත්තිය කියපු විලාසයෙන් මට කල්පනා වුනා මොනතරම් දක්ෂතාවයක් ගායනයට ඒ දූරිය තුළ තිබෙනවද කියලා. මං සොයා බලනකොට එම දූරිය ආහාර මුද්දර ලබන දරු පවුලක කෙනෙක්. තවත් අවස්ථාවකදී දූවයකින් යමක් නිර්මාණය කරලා තිබුණා. කාගෙන්වත් උපදේශයක් නැතිව තමන්ගේ ස්ව ශක්තියෙන්. ඒ දරුවට ඒ තාක්ෂණය පිළිබඳ දැනුමක් ලබා දුන්නා නම් මහ දක්ෂයෙක් වෙන්නට ඉඩ තියෙනවා. දුගී දුප්පත් පවුල්වල අලුත් දේවල් නිර්මාණය කරන අය අපට හමුවෙනවා. අපි මෙතෙක් ඒවා ගැන සෙවීමක් කළේ නැහැ. අපි සෙව්වානම් සෙව්වේ ආදයම් බද්දක් ගැනීමට මිසක්, ඒ උදවියට බරක් දෙන්න මිසක්, ඒ උදවියගේ ජීවිත සැහැල්ලු කරන්න ඕනෑ කරන උදව්වක් උපකාරයක් කරන්න නෙවෙයි. යටත් විජිත යුගයේ අපේ පාලකයෝ කළේ අපේ හැම දෙයක්ම සූරා කෑම. අපට වැඩෙන්න යමක් කළේ නැහැ. අපේ සහජ දක්ෂතාවයන් සොයා ගත්තේ නැහැ. අපි නිදහස් වෙලත් අර ඒ වහල් මානසිකය, ඒ වහල් පාලන තන්ත්‍රය තවමත් අප අතර රැඳී තියෙනවා. මේ මානසිකය වෙනස් වෙන්න ඕන. මෙන්න මේක හොඳට ඒත්තු යන්න ඕන මේ කටයුතුවලට සම්බන්ධවන හැම දෙනාටම.

ඒ නිසා අද නොසලකා හැර තිබෙන අති විශාල ජන සමූහයක් සැලකිල්ලට අරගෙන ඒ උදවිය රටේ සංවර්ධනයට හා නිෂ්පාදනයට හවුල් කරගෙන රටේ සම්පත්, ශක්තිය වැඩිදියුණු කර ගැනීමටයි අපි උත්සාහ කරන්නෙ. මාසයකට රුපියල් දෙදහස් පත්සීයක් මේ දරු පවුල්වලට දීමේ ව්‍යායාමය මං කලින් කිව්වා වගේ පිං පඩි දීමක් හැටියට සලකන්න එපා. අපේ සමාජයට සම්පත් ප්‍රමාණයක් එකතු කර ගන්නට කරන ආයෝජනයක්. ඒ වගේම ආහාර මුද්දරවලින් ජීවත් වන අය ගැන පමණක් නොව මුළු ගම්මානයෙම ඉන්න සැම දරු පවුලක් ගැනම සොයා බලා, ඔවුන්ගේ අඩුපාඩුකම්වලට අපෙන් දිය හැකි උදව් උපකාර දීලා ඔවුන්ගෙන් සමාජයට ගන්න පුළුවන් ශක්තිය ගැනීමයි මේ වැඩ පිළිවෙළේ පරමාර්ථය. මේ වැඩ පිළිවෙළට අමුතු බදු පැනවීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. කාගෙවත් පඩි කැපීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. අපේ තිබෙන සම්පත් මේ ප්‍රමුඛත්වයට යොමු කිරීම පමණයි අවශ්‍ය වෙන්නේ. ඇත්ත වශයෙන්ම අපි අමතක කොට තිබෙන සම්පත් සමහාරයක් සමාජයට ලබා

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ගැනීමයි අපි කරන්න යන්නේ. ඒ වගේම මම නියමකරලා තිබෙනවා අපේ නැති බැරි ජනතාවට දිය හැකි ඉඩම් ප්‍රමාණ නම නියම කිරීමට හා ඒ තිබෙන ඉඩම් ප්‍රමාණය එකතු කර ගැනීමට විධිවිධාන යොදන්නය කියලා. අපේ කල්පනාව නම් හැම දරු පවුලකටම ඔවුන්ගේ අවශ්‍යතාවයට ප්‍රමාණ වන ඉඩම් කැබැල්ලක් තියෙන්න ඕන. ඔවුන්ට කියලා ගෙයක් දොරක් තියෙන්න ඕන. නාගරික වශයෙන් සමහර විට ඉඩම් නොතිබුණොත් ඔවුන් ජීවත් වන නිවස, ඔවුන් සන්තක කරන්න අපට පුළුවන් වෙයි. ඒ නාගරික ජනතාව කිසියම් නිෂ්පාදනයකට යොමු කරන්න අපට පුළුවන් වෙයි. මෙන්න මේ විධියේ සංකල්පයක් තමයි ජනසවිය තුළ තියෙන්නේ.

මම 1988 ජූලි මාසේ තුන්වෙනි ද ගම්උදාව ජයන්තියේ දී කළ කථාව සම්පූර්ණයෙන්ම තමුන්නාන්සේලාට කියෙව්වොත් මේ සංකල්පය වඩාත් අවබෝධ කර ගන්න පුළුවන් වෙයි. මං බලාපොරොත්තු වෙනවා මේ වැඩ පිළිවෙළ ගැන ක්ෂේත්‍ර නිලධාරීන්ටත් කථා කරන්න විසි පස් වෙනිදාට. මං කල්පනා කළේ මේ දර්ශනයේ බිදක් මූලික වශයෙන් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සංස්ථාවල ක්‍රියා කරන තමුන්නාන්සේලාට ප්‍රථමයෙන්ම පැහැදිලි කර දෙන්න. දැන් මේ ඒකක අපි පිහිටුවන්න බලාපොරොත්තු වෙන්නේ ගම්මාන විසිපන්දහක. ඒ ඒකක ක්‍රියාත්මක වන විට ගමේ උදවියත් රජයේ නිලධාරීනුත් සම්බන්ධවෙලයි මේ ඒකකයක් පිහිටුවා ගන්නේ. අපට ගමේ තිබෙන ආයතනවල සහයෝගය ලබා ගන්න පුළුවන්. ගමේ මට්ටමේ නගර මට්ටමේ නොයෙක් ස්වෙච්ඡා සංවිධාන තිබෙනවා. ඒ ස්වෙච්ඡා සංවිධාන අද ග්‍රාමෝදය මණ්ඩලවලට ඒකරාශි වෙලාත් ඉන්නවා. ඒ හැම දෙනාම මේකට සම්බන්ධ කර ගන්න ඕන. ඇත්තවශයෙන්ම අපේ රටේ තිබෙනවා ප්‍රධාන ආයතන තුනක්. ඒවා දැන් වෙන වෙනම ක්‍රියා කරනවා. ගම්වල තිබෙන පූජ්‍යස්ථාන, ඒ කියන්නේ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන.

දැන් බලන්න කල්පනා කරල මේ ආගමික සිද්ධස්ථානවල මොන විධියේ හැඟීම් සම්භාරයක් ජනතාවට දෙනවද ? මේ ආගමික සිද්ධස්ථානවලින් බෙද දෙන්නේත් ධාර්මික සිතුවිලි. ඒ ස්ථානවල ඉන්න පූජ්‍ය පූජක උතුමන්ලා ආදර්ශයක් දෙනවා. ඊළඟට අපේ හැම ගම්මානයකම පාසල් තියෙනවා. පාසල්වලිනුත් කරන්නේ අපේ හැදී වැඩීගෙන එන දරු පරම්පරාවලට සමාජයේ ජීවත් වන හැටි කියාදීම. ඒ වගේම හැම පළාතකම පොලීසියකුත් තියෙනවා. පොලීසියෙන් කරන්නෙත් රටේ නීති රීති ආරක්ෂා කර ගැනීමට ජනතාවට උපදෙස් දී මග පෙන්වීමයි. ඒ ආදි කටයුතු තමයි පොලීසියකින්

බලාපොරොත්තු වෙන ප්‍රධාන කාර්යය. නීතිය කැඩීමෙන් සමාජයට සිදුවන අපරාධය ඒ පුද්ගලයට හෝ කණ්ඩායමට පැහැදිලි කර දීමටයි. පොලීසිය ඒ පුද්ගලයාව උසාවියක් හමුවට පමුණුවන්නේ. එතකොට දඩුවම් තීරණය වන්නේ උසාවියේ තීරණය මතයි. ඒ තැනට යනකන් පොලීසිය ජනතාව හා සම්බන්ධවී ජනතාවට මඟ පෙන්වීමේ කාර්යයයි කරන්නේ. ඇත්ත වශයෙන්ම මූලික වශයෙන් ගත්තොත් මේ කියන ආයතන තුන එනම් ආගමික සිද්ධස්ථාන, පාඨශාලාව හා පොලීසිය එකම විධියේ පරමාර්ථයක් විවිධාකාරයෙන් ඉටු කරන ආයතන තුනක්. නමුත් අපට බොහෝ විට පෙනෙනවා මේ ආයතන තුන අද වැඩ කරන්නේ වෙන වෙනම. මේ වැදගත් ආයතන තුනේ සම්බන්ධීකරණයක් නැහැ. මම කැමතියි මේ ආයතන තුන සම්බන්ධීකරණයක් ඇති කරගෙන ඒ පළාතේ ජනතාවගේ සුභසිද්ධියට වැඩ කරනවා දකින්න.

මම පොලිස්පතිතුමාට දැනටමත් කියලා තියෙනවා, ඒ ඒ පොලිසි භාර නිලධාරීන්ට තමන්ගේ නිල ඇඳුම නැතුව සාමාන්‍ය පුරවැසියන් හැටියට ඇඳුමකින් සැරසිලා ගිහිල්ලා ගමේ සිද්ධස්ථානයේ පූජ්‍ය හා පූජක තුමන්ලා හමුවෙලා සාකච්ඡා කරන්න "අපි පොලිසියේ හැටියට ඉන්නේ සාමයක් ඇති කරන්න. තමුන්නාන්සේලාගෙන් ඒ සාමයට ලොකු රුකුලක් ඇති වෙනවා. අපි හැමවිට ලැස්තියි එකට වැඩ කරන්න" කියල. ඊළඟට යන්න ඕනෑ පාඨශාලාවට. ගිහිල්ලා විදුහල්පති හා ගුරු මණ්ඩලය හමුවෙන්න ඕන. ඒවගේ ම වැඩිහිටි ශිෂ්‍යයෝ ඉන්නවා. ඒ උදවිය එක්ක සාකච්ජා කරන්න ඕන. කියලා දෙන්න ඕන. "අවහිරයක් කරදරයක් නැතිව ජීවත් වෙන්ට තමුන්නාන්සේලා මේ පාසලේ ඉගෙන ගන්නවා. අපි ඉන්නෙත් ඒක හරියට කෙරෙනවද නැද්ද කියලා බලන්න. නමුත් අපි කැමතියි මේ දරුවෝ ඉගෙන ගන්නා කාලයේදීම අපි ලබලා තිබෙන පුහුණුවෙන් කොටසක් මෙ දරුවන්ටත් කියලා දෙන්න." එතකොට පාසලෙන් අස්වෙලා රැකියාවකට යන විට ඒ අභ්‍යාසයත් ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්.

බලන්න, මේ වැදගත් ආයතන තුන, ඒ විධියේ සම්බන්ධයක් ඇතිව වැඩ කළහොත් මොන විධියේ වෙනසක් සමාජයේ ඇතිවෙයිද කියල. දැන් මේ ආයතන තුනම වෙන වෙනම වැඩ කරන්නේ. සම්බන්ධයක් නැහැ. එක ආයතනයක් කරන දේ අනික් ආයතනය දන්නේ නැහැ. එතකොට මෙ ජනසවිය තුළට මෙවැනි වැඩ පිළිවෙළකුත් ඇති වෙන්න ඕන. මේ ජනසවිය අපි ඇති කරන්නේ ආධ්‍යාත්මික වශයෙනුත් ආර්ථික වශයෙනුත් ජනතාවගේ සුභ සිද්ධිය ඇති කරන්න. ඒ මාර්ගයෙන් තමයි සාමය උදා වෙන්නේ, සංවරය ඇති වෙන්නේ, සමෘද්ධිය අත්පත් කර ගන්න පුළුවන් වෙන්නේ. මේ දර්ශනය, මෙ

ප්‍රතිපදාව අපි කවුරුත් තේරුම් ගන්න ඕන. මාව ජනාධිපති හැටියට මේ රටේ ජනතාව පත්කර ගත්තේ මේ පදනම් තුන මත අපේ රටේ පාලනතන්ත්‍රය හසුරවන්නයි. ඒනිසා, මෙක නමුත්නාත්සේලා ඉහල මට්ටමේ සිටම අවබෝධකර ගන්න. මේ වැඩ පිළිවෙළට අදාල වන හැටියට තමයි නමුත්නාත්සේලාගේ ආර්ථික පිළිවෙත් සකස් වෙන්නේ.

තාක්ෂණය අපට අවශ්‍යයි. නමුත් ඒ තාක්ෂණය ජනතාව යටපත් කරන තාක්ෂණයක් නොවිය යුතුයි. නිදර්ශනයක් හැටියට මේ ලඟදි සිදුවුන සිද්ධියක් මට කියන්න පුළුවන්. නමුත්නාත්සේලා දන්නවා අහුන්ගල්ලේ ඇති වුන ඛේදවාචකය. රේල් ගේට්ටුවක් නැතිකම නිසා දුම්රිය හා වාහනයක් ඝට්ටනය වුණා. හතලිස් ගණනක් අහිංසක උදවිය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළුව එතනම මරණයට පත්වුණා. සියක් පමණ තුවාල ලැබුවා.. මේකට හේතුව මොකක්ද ? එතන රේල් ගේට්ටුවක් නොතිබීම. එතන දුම්රිය එන වෙලාවට පාර අවහිර නොවීම. දැන් එවැනි තැනක රේල් ගේට්ටුවක් සවිකරන්න රුපියල් තුන්ලක්ෂ පනස් දහසක් පමණ වියදම් වෙනවා. මේ වගේ ස්ථාන හත්සිය ගණනක් තියෙනවා විවෘතව. එතකොට බලන්න එක තැනකට රුපියල් තුන් ලක්ෂ පනස් දහසක් වියදම් වෙනවා නම් හත්සිය පොලකට කොයි තරම් මුදල් සම්භාරයක් අවශ්‍යද ? දැන් ඒතරම් ලක්ෂ ගණනක් වියදම් නොකර එක තැනකට, මගේ හිතේ රුපියල් එකසිය විසිපහකින් පමණ ඒ අවශ්‍යතාවය සම්පූර්ණ වෙලා තියෙනවා. අද මිනිස් ශ්‍රමය පාවිච්චි කර ඒ සඳහා පැය විසිහතරේම තිබෙනවා රැකවලක් ආරක්ෂාවක්. ආහාර මුද්දර වලින් ජීවත් වන ඒ ස්ථානය අවට ඉන්න හය දෙනෙකුට රක්ෂාව ලැබිලා තියෙනවා. එතකොට එක් කෙනෙකුට මාසෙකට රුපියල් දාහක් ලැබෙනවා. එතකොට ජනසවිය යටතේ ඒ දරු පවුලකට ලැබෙන්නේ රුපියල් එක්දහස් පන්සියයක් පමණයි. එතකොට අපි කිව්වා දුම්රියක් එන වෙලාවට බම්බුවක් හරි වෙන ලීයක් හරි හරස් කරන්ට කියල. සතියක් ඇතුලත ඒ කාර්යය කෙරිලා ඉවරයි. එතකොට බලන්න රුපියල් ලක්ෂ තුන්දාහක්, හාරදාහක් පමණ වියදම් වන වැඩක් කොයි තරම් පහසුවට ලාබයට මිනිසාට ප්‍රයෝජනයක් වෙන විධියට සිදුවුනාද කියල. දැන් අනිත් අංශවලදී අපි මේ විධියට කල්පනා කරන්න පුරුදු වෙන්න ඕන.

අද හුගක් කාර්යාලවල ලිපිගොනු මහත් කරන එක තමයි කරන්නේ. හුගක් දුරට ලියකියවිලි අඩු කරන්න පුළුවන්. පෝර්ම කොළ පිරවීම අඩු කරන්න පුළුවන්. කාර්යාලයට එන අය නිතර සාකච්ඡා කරන්න ඕනෑ තමන්ට අදාල විෂයයන් ගැන. කාර්යාලවල ඇදන් වගේ ලොකු මේස තියෙන්නේ. මෙච්චර

කාලයක් අපි මේ වගේ දේවල් ගැන අවධානය යොමු කරලා නැහැ. දැන් බලන්න තමුන්නාන්සේලා ඉදිරියේ තිබෙන මේස. අඩියකුත් අඟල් කීපයක් විතර පළල මේසයක්. ලිපිගොනුවක් තියාගෙන වැඩ කරන්න පුළුවන් ඔය මේසේ. ඔක එච්චර පොඩි වැඩිනම් තව ටිකක් පළලට හදා ගන්න පුළුවන්. මං දැකල තිබෙනවා. කාර්යාලවල තිබෙන මේස දෙකට කපලා පාවිච්චි කරන්න පුළුවන් මේස දෙකකට. මේස ලොකු වුනාම ඉඩ කඩත් වැඩිය ඕනෑ වෙනවා. දහ දොළොස් දෙනෙක් වැඩ කරන්න පුළුවන් ස්ථානයේ තුන් හතර දෙනයි වැඩ කරන්නේ. ඉතින් අනවශ්‍ය ගොඩනැගිලි හදන්න ඕන. අනවශ්‍ය ගෘහ භාණ්ඩ ගන්න ඕන. අනවශ්‍ය ටැලිෆෝන් සවි කරගන්න ඕන. මේ ඔක්කෝම අඩු කර ගන්න පුළුවන් අපි අධිෂ්ඨානයක් ඇතිව වැඩ කළොත්. මම භාණ්ඩාගාරයට නියම කරලා තිබෙනවා මේවා ගැන සොයන්න බලන්න.

අපි යම් ව්‍යාපෘතියකට මුදල් වෙන් කෙරුවාම ඒකෙන් වැඩි කොටසක් යන්නෙ ඒකෙ සංවිධානයට. මම 1977 පත්වෙලා ආපු වෙලාවේ, නිලධාරින්ට කිව්වාම මෙන්න මේවගේ ව්‍යාපෘතියක් පටන් ගන්න ඕන කියලා, මට මුලින්ම ආපු ලියවිල්ල මොකක්ද ? එහෙම නම් මේකට මෙච්චර ඉඩ ප්‍රමාණයක් ඇති කාර්යාලයක් ඕන, හතරැස් අඩි මෙච්චර වෙන්න ඕන, මේකට වාහන මෙච්චර ඕන, මේකට නිලධාරින් මෙච්චර ඕන, මේකට ටැලිෆෝන් මෙච්චර ඕන, මේකට මෙච්චර ගෘහ භාණ්ඩ ඕන, බලපුවාම ඒ ව්‍යාපෘතියට වියදම් කරන්න යන මුදලින් හතරෙන් තුනක්ම යන්නේ මේ සංවිධානයට. අපි එහෙමනම් නැවත කල්පනා කරන්න ඕන. තමුන්නාන්සේලාගේ කාර්යාලවල ප්‍රතිසංවිධානයක් ඇති වෙන්න ඕන. කාර්යාලය ලොකු වෙන්න, වෙන්න, මකුළු දැලුත් වැඩියෙන් බැඳෙනවා. මේස ලොකු වෙන්න වෙන්න ඒවායේ යට මකුළු දැල් බැඳෙනවා. තමුන්නාන්සේලා ගිහිල්ලා බලන්න තමුන්නාන්සේලාගේ මේසෙ යට තියෙන්නේ මොනවාද කියල. හොඳ ලක්ෂණ ඇඳුම් ඇඳගෙන හැඩහුරුකම් ඇතිව වාඩිවෙලා වැඩ කරන්නේ යට දූවිලි තිබෙන මකුළු දැල් තිබෙන මේසයක. කවුද මේ ගැන සොයන්නේ බලන්නේ. මම දැකල තියෙනවා කරාමය ඇරලා දවස් ගණන් වතුර අපතේ ගිහිල්ල තිබෙන අවස්ථාවන්. විදුලි බලය නතර කිරීම, එහෙම නැත්නම් කරාමය වහලා තැබීම, කාර්යාලය පිරිසුදුව තැබීම ආදිය ගැන කවුද සොයා බලන්නේ. අපි මේවා ගැන කිසිම සෙව්ල්ලක් බැලිල්ලක් නැහැ. අන්න ඒ නාස්තිය නතර කරන්න අමුතු බදු අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නාස්තිය නතර කළහොත් මේ ජනසවිය වගේ තුනක් හතරක් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

දැන් තමුන්නාන්සේලා ගිහිල්ලා හිතන්න. හිතලා මටත් උපදෙස් දෙන්න. මේ වැඩ පිළිවෙළ මීටත් වඩා හොඳින් කරන්නට ක්‍රමයක් තිබෙනවයි කියා. මම

තමුන්නාන්සේලාගෙන් උපදෙස් බලාපොරොත්තු වෙනවා. මම බලාපොරොත්තු වෙනවා ක්ෂේත්‍ර නිලධාරීන්ටත් කථා කරන්න. විධිපස් වෙනිදාට. මෙන්න මේ දර්ශනය අනුව මෙ සංකල්පය අනුව අපේ පරිපාලන තන්ත්‍රයේ සම්පූර්ණ ප්‍රතිසංවිධානයක් ඇති කරන්න මම තමුන්නාන්සේලාට භාර කරනවා.

පුළුවන් තරම නාස්තිය අඩු කරන්න. එකම පළාතට නිලධාරීන් ගණනාවක් යනවා වෙන වෙනම වාහන වල. නමුත් ඒ තුන් හතර දෙනාටම එකම වාහනයේ ගිහිල්ලා එන්න පුළුවන් කම තිබෙනවා. මට කියන්න පුළුවන් එක නිදර්ශනයක්. මෙ නාස්තිය පිළිබඳව. " අල්මාරියක් අරගෙන ලොරියක් ගියා කොළඹ ඉදල ගාල්ලට. හිස් ලොරියක් ගියා ගාල්ලට එහෙ තිබෙන බඩුමුට්ටු වගයක් ගෙන එන්න කොළඹ ට. මෙ දෙකම සිද්ධ වුනේ එකම කාර්යාලයේ. මෙකේ පුදුම දේ. මේ විෂය භාර ලිපිකරුවෝ දෙන්නා ඒ කාර්යාලයේ වැඩ කරන්නේ මූණට මූණ බලාගෙන. එක්කෙනෙක් එක ලොරියක් ඇරියා බඩු මූට්ටු ඇතුව. අනික් එක්කෙනා තව ලොරියක් ඇරියා බඩු මුට්ටු නැතිව එහෙ තිබෙන බඩු මුට්ටු මෙහාට ගේන්න. මේ දෙන්නම මූණට මූණ බලාගෙන වෙන ඕනෑම දෙයක් ගැන කථා කරනවා. විශේෂයෙන්ම රේස් දාන එක ගැන මෙ දෙන්නා හොඳට සාකච්ඡා කරනවා. මෙ සිද්ධිය දැන ගත්තාම මම හොයලා බැලුවා. කොහොමද මෙක වුනේ. කාගෙන්ද මෙක වුනේ කියල. මෙක හොයන්න ඇරිය නිලධාරියා මට ඇවිල්ලා කිව්වේ මෙක හොයන්න යන කොටත් මෙ දෙන්නා අශ්වයින්ගේ බර ආදිය ගැනත් හොඳට සාකච්ඡා කරමින් සිටිය. හැබැයි අර තමන් කරපු වැඩ ගැන කවදාවත් කථාකරන්නේ නැහැ. එයාට කියන්න තිබුණා ' මම වාහනයක් යවනවා ගාල්ලට මෙන්න මෙහෙම බඩු මුට්ටු වගයක් යවන්න. එතකොට අරයා කියනවා අයිසේ, මටත් තියෙනවා එහෙන් ගෙන්නා ගන්න දෙයක්. ' මෙ එක ලොරියෙන්ම එය කර ගන්න තිබුණා. ඒ ගැන කථා කරලා නැහැ. මෙක ගැන විමසුවාම මොකක්ද දීපු උත්තරය ' අපට කියලා තියෙන්නේ ෆයිල් එකේ ලියන්න කියලා. ' දෙන්නාගෙම ෆයිල් එකේ මෙක තියෙනවා. නමුත් දෙන්නට දෙන්නා කියවන්නේ නැහැ. දෙන්නා විෂය දෙකක් භාරව ඉන්නේ. එක ෆයිල් එකක් යනවා එක නිලධාරියෙකුට. අනික් ෆයිල් එක යනවා වෙන නිලධාරියෙකුට. කරුණාකරලා මෙ ක්‍රමය වෙනස් කරන්න. මෙවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් චක්‍ර ලේඛන එවන්න වුවමනා නැහැ. ඒ ඒ දෙපාර්තමේන්තුව භාර උදවිය. ඒ ඒ අමාත්‍යාංශ භාර ලේකම්වරු. ඒ ඒ අංශ භාර උදවියට මෙය ප්‍රතිසංවිධාන කරන්න පුළුවන්.

මෙ විදියට කල්පනා කරලා ජනසවිය සවිමත් කරන හැටියට මං තමුන්නාන්සේලාගෙන් මෙ අවස්ථාවේ ඉල්ලනවා. අද සාම්ප්‍රදායික වශයෙන්

කරගෙන යන වැඩ පිළිවෙලට වඩා ඉදුරාම වෙනස් විධියට මේ ජනසවිය ක්‍රියාත්මක වෙන්න ඕන. මේ ජනසවියට ජනතා සහභාගීත්වය ගන්න ඕන. මේක ජනතාවට උපකාරයක් කරලා. ඔවුන්ගේ උපකාරය රටට උපකාරයක් කර ගැනීමට ගෙන යන වැඩ පිළිවෙලක් නිසා කාටවත් බරක් විය යුතු නැහැ. තමුන්නාන්සේලාටත් බරක් විය යුතු නැහැ. තමුන්නාන්සේලාටත් පුදුම විධියේ තෘප්තියක් ලබන්න පුළුවන් වැඩ පිළිවෙලක් නිසා මෙය සාර්ථක කරගැනීම සඳහා අධිෂ්ඨාන කරගන්නා හැටියට, මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.